# බස්නාහිර පළාත් නිවේදක වැඩමුළුව හා  තරගාවලිය 2022

## උපදෙස් පත්‍රිකාව හා අයදුම්පත්‍රය

බස්නාහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය  මඟින් 2022 නිවේදක වැඩමුළුව හා තරගාවලිය පැවැත්වීමට සැළසුම් කර ඇති අතර ඒ අනුව පහත සඳහන් උපදෙස් හා කොන්දේසි අනුව උක්ත තරගාවලිය වෙනුවෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

තරග කොන්දේසි

1. මේ සඳහා සහභාගී විය හැක්කේ බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන් සඳහා පමණි.

   මෙම තරගාවලිය පහත සඳහන් වයස් කාණ්ඩ තුන යටතේ ක්‍රියාත්මක වේ.

   - කණිෂ්ඨ අංශය - 2022.04.25 දිනට වයස අවුරුදු 11 සම්පූර්ණ වූ හා වයස අවුරුදු 16 ට අඩු
   - ජ්‍යෙෂ්ඨ අංශය - 2022.04.25 දිනට වයස අවුරුදු 16 සම්පූර්ණ වූ හා වයස අවුරුදු 20 ට අඩු
   - විවෘත අංශය - වයස අවුරුදු 20 සිට 35 දක්වා

2. පාසල් අයදුම්කරුවෙක් නම් විදුහල්පති /නියෝජ්‍ය විදුහල්පති හා ග්‍රාමනිලධාරි විසින් සහතික කර අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර අනෙකුත් සියලුම අයදුම්කරුවන් ග්‍රාමනිලධාරි විසින් සහතික කර අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
3. විවෘත අංශය සඳහා පාසල් ගුරු මහත්ම මහත්මීන්ට ද සහභාගී විය හැක.

4. සෑම තරගකරුවෙක්ම අයදුම්පත්‍ර යොමු කිරීමේදී ජාතික හැඳුනුම්පත/ වලංගු විදේශ ගමන් බලපත්‍රය/ වලංගු රියදුරු බලපත්‍රය/උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතුයි.

5. තරග **සිංහල** මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.

6. දිස්ත්‍රික් මට්ටමින් තරගකරුවන් තෝරාගැනීමේ දී තමන් කැමති නිවේදනයක් හා විනිශ්වය මණ්ඩලය විසින් ලබා දෙනු ලබන ඉදිරිපත් කිරීමක් සිදු කළ යුතුවේ.(ඉදිරිපත් කිරිම ප්‍රවෘත්ති නිවේදනයක් නොවිය යුතුය.) දිස්ත්‍රික් මට්ටමින් තරගකරුවන් තෝරාගැනීමේ තරග 2022 ජුනි මාසයේ අග දී පැවැත්වෙන අතර තරගය පැවැත්වෙන නිශ්චිත දිනයන් අයදුම්කරුවන් වෙත ඉදිරියේ දි දැනුම් දෙනු ලැබේ.

7. දිස්ත්‍රික් මට්ටමින් මූලික තරග පවත්වා තෝරාගනු  ලබන තරගකරුවන් 110 දෙනෙකු සඳහා නිවේදක වැඩමුළුව පවත්වා පළාත් තරගය වෙත ඉදිරිපත් කර ජයග්‍රාහකයින් තෝරාගනු ලැබේ.

8. ජයග්‍රාහකයින් සඳහා සහතික පත්‍ර හා මූල්‍ය ත්‍යාග පිරිනමනු ලැබේ.

9. තරගයට අදාල සියලු ක්‍රියාකාරකම් සෞඛ්‍ය නීති රීති හා මාර්ගෝපදේශයන්ට අනුකූලව පැවැත්වේ.

10. මෙම උපදෙස් පත්‍රිකාව හා අයදුම්පත්‍රය අමාත්‍යාංශයේ www.moe.wp.gov.lk දරන වෙබ් අඩවිය මගින් ද ලබා ගත හැකිය.

11. අයදුම්පත් යොමු කිරීම
    - ඔබ විසින් සහතික කර සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය පැහැදිලිව ලබා ගත හැකි පරිදි SCAN කර announcingwp@gmail.com විද්‍යුත් ලිපිනයට යොමුකිරීම.

      හෝ
    - ඔබ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බස්නාහිර පළාත් සංස්කෘතික නිලධාරි වෙත බාරදීම.

      හෝ
    - ලියාපදිංචි තැපෑලෙන් යොමුකිරීම.
      මෙහි දී අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ **බස්නාහිර පළාත් නිවේදක තරගාවලිය 2022** යනුවෙන් සඳහන් කර පහත ලිපිනයට යොමුකිරීම.

**ලේකම්**
**බස්නාහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය,**
**02 මහල,**
**නව පළාත් සභා කාර්යාල සංකීර්ණය,**
**204,**
**ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,**
**බත්තරමුල්ල.**

12. අයදුම්පත් 2022.04.25 දිනට පෙර එවිය යුතුය.

විමසීම් : රන්දි කොළඹුන්න මිය - 0718272052
කෞමදී මධුභාෂිණී මිය - 0702730651

- වැඩිදුර තරග විස්තර සඳහා ඔබට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බස්නාහිර පළාත් සංස්කෘතික නිලධාරී මහතා / මහත්මිය සම්බන්ධ කර ගත හැක.

**ලේකම්,**

**අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය(බ.ප)**